02

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1395/22 – 2005 ජුනි 03 වැනි සිකුරාදා – 2005.06.03

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

24අ වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24ආ වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු එකී විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිනී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වන මා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාල සභාවේ සහ සනාතන සභාවේ සහ සංගීත සහ නැටුම් පිළිබඳ ස්වාමි විපුලානන්ද විද්‍යාලයේ එකඟත්වය ඇතිව මේ නියමය මගින්–

(i) 2005.03.14 දින සිට බලපවත්වන පරිදි සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ උසස් අධ්‍යාපනය ලබාදීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කාර්ය සඳහා උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක් වශයෙන් සංගීතය සහ නැටුම් පිළිබඳ ස්වාමි විපුලානන්ද විද්‍යාලය පිළිගනිමි ;

(ii) එකී ආයතනය ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරමි ;
සහ

(iii). එම ආයතනයට “ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද විද්‍යාලය” යන නාමය හා අභිධානය දෙමි.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපතිනි.

2005 මැයි මස 26 වැනි දින,
කොළඹ දී ය.

06-388/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A-G 005653 -1000 (2005/06)